# ලංසු සඳහා ආරාධනයයි.
# ප්‍රධාන අමාත්‍යාංශය - උතුරුමැද පළාත

**ව්‍යාපෘතියේ නම : මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට ලබා දීම.**

1) උතුරුමැද පළාත් සභා අරමුදලින් ඉදි කරන ලද මන්නාරම් පාරේ පිහිටා ඇති මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 28 ක් බදු කුලී පදනම මත ලබා දීමට මා විසින් ලංසු පත් කැඳවනු ලැබේ.මෙම ප්‍රසම්පාදනය සඳහා වන ලංසු ඉල්ලුම් පත් උතුරුමැද පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයෙන් 2017.06.03 සිට 2017.06.19 දක්වා පෙ.ව. 09.00 සිට ප.ව.03.00 දක්වා කාර්යාල වේලාවන් තුළ ලබා ගත හැක.

2) ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමයට ලංසු කැඳවනු ලබයි.

3) කඩ කාමරයක් කුලියට ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අසාදුලේඛණගත නොවූ අයෙකු සහ පහත සඳහන් සුදුසුකම් ලැබූ අයෙකු විය යුතුය.

   I. උතුරු මැද පළාතේ වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් මේ දක්වා සපුරා තිබිය යුතුය.
   *II. කෘෂි ක්ෂේත්‍රයේ නිරත ගොවි පංතියේ ඉල්ලුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.*

4) මාසික බදු කුලිය රු. 8500 /= ක් වන අතර ඇප තැන්පත් ( Key money ) අවම මුදල රු. ලක්ෂ 1,700,000/= කි. එක් කඩ කාමරයක් සඳහා එක් අයෙකුට වඩා ඉල්ලුම්කර ඇති විට ඇප තැන්පතු වශයෙන් වැඩි වටිනාකමක් ලබාදීමට එකගතාවය පලකර ඇති ඉල්ලුම්කරු වෙත එම කඩ කාමරය ලබාදීමට කටයුතු කරණු ලැබේ. ජල හා විදුලි බිල්පත් බදුකරු විසින් ගෙවාගත යුතු අතර වසර 05 කට පසු කරනු ලබන නැවත තක්සේරුවකට අනුව කඩකුලිය ගෙවීමට බදුකරු එකග විය යුතුයි

5) මිල ගණන් ඉදිරිපත් කරන ලංසු ලේඛණ සමඟ 03(I,II,III) සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අදාල ලේඛණ අමුණා තිබිය යුතුය.

6) මෙම ප්‍රසම්පාදනයට අදාල සියලු ලංසු පත්‍රිකා පරීක්ෂා කිරීම හා වැඩ විස්තර පිලිබඳව අවශ්‍ය තොරතුරු උතුරුමැද පළාතේ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගෙන් කාර්යාලීය වේලාවන් තුල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලබාගත හැකි අතර, එම කාර්යාලයේ දුරකථන අංකය025-2236428 වේ.

7) සුදුසුකම් ලත් ලංසුකරුවන් ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය,උතුරු මැද පළාත වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පිළියෙල කරන ලද ලංසුපත් මිලදී ගත හැකි අතර, සතියේ වැඩ කරන දිනයන්හිදී පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ලංසුපත් නිකුත් කරනු ලබන අතර 2017.06.02දින සිට 2017.06.19 දින දක්වා ලංසුපත් නිකුත් කරනු ලැබේ.ආපසු නොගෙවනු ලබන රුපියල්3,000.00 ක් ලංසුපත් ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.

8) සෑම ලංසුවක් සමඟම රු 15000 වටිනාකමට පිලිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.ලංසු ඇපකරය 2017.12.27 දින දක්වා වලංගු විය යුතුය.(දින 105)

9) ලංසු අනු පිටපතක්ද සහිතව 2017.06.19 වන දින පෙ.ව 03.00 ට පෙර ලේකම්/සභාපති ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,4 වන මහල, පලාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.ලංසු භාරගැනීම අවසන් වූ විගස මෙම අවස්ථාවට සහභාගී වී සිටින ලංසුකරුවන් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

10) ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛණ පිළියෙල කිරීම හා බෙදාහැරීම වෙනුවෙන් දරනු ලබන කිසිදු වියදමක් සඳහා පළාත් ප්‍රධාන ලේකම් වගකීම් රහිත වන අතර ලංසුපත් සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඉවත් කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත අයිතියක් ඇති අතර, මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ

**සභාපති**
**ප්‍රධාන ලේකම්**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව**
**ප්‍රධාන ලේකම් කාර්යාලය**
**උතුරු මැද පළාත.**